**තේ පර්යේෂණ ආයතනය**
**ශාන්ත කූම්බ්ස් වතුයාය, තලවකැලේ.**

## ඉතිහාසය කෙටියෙන්

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ආරම්භය වර්ෂ 1925 දී සිදුවිය. 1925 සහ 1957 අතර කාලයේදී වැවිලි කරුවන්ගේ සංගමයේ ශාඛාවක් ලෙස පැවති තේ පර්යේෂණ ආයතනය 1957 දී රජයට පවරා ගන්නා ලදී. වර්තමානයේදී 1993 අංක 02 දරණ තේ පර්යේෂණ මණ්ඩල පනත යටතේ ආයතනයේ කටයුතු පාලනය වේ.

## ප්‍රධාන කාර්යාලය

ප්‍රධාන මධ්‍යස්ථානය, ශාන්ත කූම්බ්ස් වතුයාය, තලවකැලේ.

## ප්‍රාදේශීය මධ්‍යස්ථාන

පහතරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, රත්නපුර.
මැදරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, මහනුවර.
ඌව උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, පස්සර
දකුණු පළාතේ උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, පස්සර.
දකුණු පළාතේ උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, කොට්ටාව, ගාල්ල
දෙනියාය උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, කොටපොල, දෙනියාය.

## අරමුණු

විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම සහ යෝග්‍ය නව තාක්ෂණ නිර්දේශ කිරීම මගින් කුඩා තේ වතු, වාණිජ තේ වගාවන් සහ තේ කර්මාන්තශාලා ආදියෙහි ඵලදාව වැඩි දියුණු කිරීම.

## ක්‍රියාකාරකම්

- වඩාත් යෝග්‍ය ලක්ෂණ සහිත ස්ථානීය-සුවිශේෂිතා දක්වන රෝපණ ද්‍රව්‍ය නිපදවීම වේගවත් කිරීම.
- තේ බිම් සඳහා පොහොර සහ ඩොලමයිට් යෝග්‍ය ලෙස භාවිතය.
- යෝග්‍ය සහ ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම මගින් තේ පළිබෝධ පාලනය.
- තේ වගා බිම් පුනරුත්ථාපනයේදී සිදුවන ආර්ථික හානි වළක්වා ගැනීම හෝ අවම කර ගැනීම.
- අතුරු භෝග වගාවන් සහ භෝග විවිධාංගීකරණය මගින් ඵලදායී භූමි භාවිතය ඉහළ නැංවීම.
- නිෂ්පාදිත තේ වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සහ අගය එකතු නිෂ්පාදන හඳුන්වා දීම.
- තේ නිෂ්පාදනයේ විවිධ අවස්ථාවන් ස්වයංක්‍රීය කිරීම සහ පරිගණකගත කිරීම සහ බලශක්ති පිරිවැය අවම කිරීම.
- කර්මාන්තශාලාවන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීම සහ අන්තර්ජාතික ප්‍රමිතීන් කරා ළඟා වීම.
- ශ්‍රම ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහ ගරුත්වය ආරක්ෂා වන්නාවූ ක්‍රියාමාර්ග හඳුන්වාදීම.
- හඳුන්වා දෙන තාක්ෂණයන්ගේ ආර්ථික ඇගයීම් සහ තත්ත්ව ඇගයීම් සිදුකිරීම, එම තොරතුරු පාර්ශව කරුවන් වෙත බෙදා හැරීම සහ මහා පරිමාන තේ වතු සේවකයන් සහ කුඩා තේ වතු හිමියන් පුහුණු කරන්නන් පුහුණු කිරීම.

**සම්බන්ධවිය හැකි පුද්ගලයන්**

| නම | දූරකථනය | ෆැක්ස් අංකය | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| සභාපති, ආචාර්ය එස්.එස්.බී.ඩී.ජී. ජයවර්ධන මහතා | 060-2519619 | 052-2258800 | chairman@tri.ac.lk |
| අධ්‍යක්ෂ, ආචාර්ය අයි. එස්.බී. අබේසිංහ මහතා | 060-2519616 | 052-2258229 | isarathb@hotmail.com |
| පොදු දූරකථනය | 051-2222601 | | Postmast@tri.ac.lk |

**වෙබ් අඩවිය:** www.tri.lk